# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1997 අංක 34 දරන ශ්‍රී ලංකා ජ්‍යොතිර් විද්‍යාඥ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1997 දෙසැම්බර් මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 දෙසැම්බර් මස 12 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 5.75 ශි. තැපැල් ගාස්තුව : රු. 2.50 ශි.

## 1997 අංක 34 දරන ශ්‍රී ලංකා ජ්‍යොතිර් විද්‍යාඥ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කලේ 1997 දෙසැම්බර් මස 10 වන දින]

එල්. ඩී.–ඕ. 39/93.

### ශ්‍රී ලංකා ජ්‍යොතිර් විද්‍යාඥ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"ශ්‍රී ලංකා ජ්‍යොතිර් විද්‍යා සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව එකී සංගමයට සම්බන්ධ සියලු ම පරමාර්ථ සහ කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙහි මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කාරණා සඳහා ද ඒ පරමාර්ථ හා කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා ඉටු කර ඇති හෙයින් ද ඒ සංගමය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් සහ ඒ ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1997 අංක 34 දරන ශ්‍රී ලංකා ජ්‍යොතිර් විද්‍යාඥ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන ශ්‍රී ලංකා ජ්‍යොතිර් විද්‍යාඥ සංගමයේ සාමාජිකයන් ලෙස දැනට සිටිනාකාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කර ගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වන දින සිට සහ ඉන් පසුව "ශ්‍රී ලංකා ජ්‍යොතිර් විද්‍යාඥ සංගමය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී සංස්ථාපිත නාමයෙන් ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි ය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේ ය. ශ්‍රී ලංකා ජ්‍යොතිර් විද්‍යාඥ සංගමය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පරමාර්ථ.

3. සංස්ථාව පිහිටුවනු ලබන්නේ පහත සඳහන් පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :-

(අ) ජ්‍යොතිර් විද්‍යාව හා එයට සම්බන්ධ වෙනත් අංශ ප්‍රවර්ධනය කිරීම, දියුණු කිරීම හා ආරක්ෂා කිරීම ;

(ආ) ජ්‍යොතිර් විද්‍යාවේ අභිවෘද්ධිය උදෙසා විශිෂ්ට සේවාවක් කළ විද්වත් ජ්‍යොතිෂවේදීන්ට සම්මාන පිරිනැමීම ;

(ඇ) ජ්‍යොතිර් විද්‍යාව පිළිබඳ පංති, දේශන සහ සම්මන්ත්‍රණ පැවැත්වීම සහ සහතික පත්‍ර ප්‍රදානය කිරීම ;

(ඇ) ජ්‍යොතිර් විද්‍යා පර්යේෂණ පැවැත්වීම සහ එවැනි පර්යේෂණවලට සහාය දීම ;

(ඉ) ජ්‍යොතිර් විද්‍යා ග්‍රන්ථ හා ප්‍රකාශන පළ කිරීම සහ ජ්‍යොතිර් විද්‍යා ප්‍රකාශනවලට දායක වීම ;

(ඊ) ජ්‍යොතිර් විද්‍යාව පිළිබඳ දැනීම පතුරුවාලීම අරභයා පුස්තකාල පිහිටුවීම ; සහ

(උ) සංස්ථාවේ ඉහත සඳහන් පරමාර්ථ සියල්ලම හෝ ඉන් කිසිවක් මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හෝ ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදාන හෝ පරිත්‍යාග භාර ගැනීමේ හෝ එකතු කිරීමේ ද සංස්ථාවේ අරමුදල් ආයෝජනය කිරීමේදී සංස්ථාවේ කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයේ නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ සියල්ලම හෝ ඉන් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ භාවිතාලීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන කවර වූවද ආකාරයක සියලු ක්‍රියා, කරුණු හෝ ඩිබෙංචර් ඉටු කිරීමේ, නිකුත් කිරීමේ සහ ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

5. (1) සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ ධූර දරන්නන්ගෙන් සහ සංස්ථාවේ රීති වලින් විධිවිධාන සලස්වා ඇති පරිදි සහ ඒ රීති වලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන වෙනත් තැනැත්තන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ (මෙහි මින් මතු "කාරක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විධායක කාරක සභාවක් වෙත, එකී රීති වලට යටත්ව, පවරනු ලැබිය යුතු ය. — සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

(2) කාරක සභාවේ යම් සාමාජිකයකු ඉල්ලා අස්වීම, ධූරයෙන් ඉවත් කිරීම, හෝ ඔහුගේ මරණය හේතුකොටගෙන කාරක සභාවේ යම් පුරප්පාඩුවක් ඇතිවුවහොත්, එවැනි පුරප්පාඩුවක් සංස්ථාවේ රීතිවලට අනුකූලව පුරවනු ලැබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සංගමයේ විධායක කාරක සභාවේ සාමාජිකයන්ගෙන් සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව සමන්විත විය යුතු ය.

6. (1) සංස්ථාව විසින්, කලින්කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, මේ පනතේ හා වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය. — සංස්ථාවේ රීති.

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුලත් කරගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම :

(ආ) නිලදරන්නන් තෝරා පත් කර ගැනීම, ඔවුන් ධූරයෙන් ඉල්ලා අස්වීම හෝ ධූරය අත්හැරීම හෝ ධූරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, පැවැත්ම සහ කාර්ය :

(ඇ) විධායක කාරක සභාවේ සාමාජිකයන් පත් කිරීම සහ ඔවුන්ගේ බලතල, පැවැත්ම සහ කාර්යය :

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, පැවැත්ම, කාර්ය සහ කර්තව්‍ය :

(ඉ) සංස්ථාවේ සහ කාරක සභාවේ රැස්වීම්වල දී අනුගමනය කළයුතු කාර්ය පරිපාටිය, ඒ රැස්වීම් කැඳවීම සහ පැවැත්වීම, ඒ රැස්වීම් පවත්වන වේලාවල්, ස්ථාන, ඒ රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර සහ ඒ රැස්වීම්වල ගණපූරණය සහ ඒ රැස්වීම්වල කටයුතු :

(ඊ) සංස්ථාවේ දේපළ කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම, සංස්ථාවේ මුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම, හා විගණනය කිරීම :

(ඹ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ වලංගුව බලපැවැත්වූ රීති, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) සංස්ථාව විසින් (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ රීතියක් සාදනු ලබන ආකාරයෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය

7. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති සංගමයේ සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට සංගමයට අය විය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් සහ සාමාජික මුදල්, මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතු කරනු ලැබූ යම් චංචල හෝ නිශ්චල දේපළක්, එය විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ කළමනාකරණ සභාව විසින් සාදනු ලබන රීතිවලට යටත්ව සංස්ථාව විසින් දරනු ලැබිය යුතු ය.

**9.** සංස්ථාවේ මුද්‍රාව, සංස්ථාවේ ලේකම්වරයාගේ භාරයේ තබාගත යුතු අතර, කාරක සභාව විසින් තීරණය කරනු ලබන ආකාරයට එය වෙනස් කරනු ලැබිය හැකි ය. තවද, කාරක සභාවේ යෝජනා සම්මතයක බලය සිට හා ලේකම්වරයා ද සභාපතිවරයා හෝ භාණ්ඩාගාරිකවරයා යන දෙදෙනාගෙන් කෙනෙකු ද ඉදිරිපිට දී මිස, කිසිම සාධන පත්‍රයකට එම මුද්‍රාව තබනු නොලැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් දෙදෙනා විසින් එකී සාධන පත්‍රයේ තම තම අත්සන් කළ යුතු ය, තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

**10.** (අ) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. විගණනය සහ ගිණුම්.

(ආ) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම්, වත්කම් හා බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(ඇ) සංස්ථාවේ ගිණුම් සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කරනු ලැබිය යුතු ය.

මේ වගන්තියේ 'සුදුසුකම් ලත් විගණකවරයා' යන්නෙන්–

(i) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ii) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්

අදහස් වේ.

සාමාජිකයන්ගේ බැඳීම සීමාකිරීම.

11. සංස්ථාවේ කිසිම සාමාජිකයකු, සංස්ථාවේ ණය බැරකම් ගෙවා සමථයකට පත් කිරීමේ කාර්යය සඳහා හෝ වෙනත් යම් කාර්යයක් සඳහා හෝ ඔවුන්ගෙන් සංස්ථාවට අයවිය යුතු දායක මුදල් ප්‍රමාණය ඉක්මවන යම් සම්මාදම් මුදලක් ගෙවීමට යටත් නොවන්නේ ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

12. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන වෙනත් තැනැත්තන්ගේ හැර ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

13. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.